## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

# ඇබෑර්තු

### 01. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරයක් :

කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර (වරාය නගර ව්‍යාපෘතිය) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (ශ්‍රී ලංකා රජය වෙනුවෙන්), නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ CHEC පෝට් සිටි කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් (ව්‍යාපෘති සමාගම) යන පාර්ශවයන් තුන එක්ව ත්‍රෛපාක්ෂික ගිවිසුමක් අත්සන් කොට ඇත. මෙම ත්‍රෛපාක්ෂික ගිවිසුම් යටතේ, ශ්‍රී ලංකා රජය වෙත මහත්වූ වගකීම් රාශියක් පැවරී ඇත. ඒ අනුව, අමාත්‍යාංශය විසින්, ශ්‍රී ලංකා රජය වෙත පැවරී ඇති වගකීම් සම්බන්ධයෙන් සමබන්ධීකරණය කිරීම, කළමනාකරණය කිරීම, නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කොට ඇත.

**ඒ අනුව පිරවිය යුතු ඇබෑර්තු :**

| තනතුර | තනතුරු ගණන | 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් කාණ්ඩය |
|---|---|---|
| **1. ව්‍යාපෘති අධ්‍යක්ෂ** | 01 | PS - 01 |
| **2. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ව්‍යුහාත්මක)** | 01 | PS - 02 |

අංක 01/2019 දරන රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ඉහත තනතුරුවලට අයදුම් කිරීම සඳහා පහත සඳහන් අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කොට තිබීම අවශ්‍යවේ.

### 02. තනතුර - ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS - 01)

**2.1 අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

පහත (1) හෝ (2) හෝ (3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම් සමග සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 8 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආයතනික / වරලත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සමග**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව, කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 14 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සමාන සුදුසුකම්,

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

**2.2 වැටුප් ගෙවීම**

රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන අය සඳහා :

200,000 - 2 x 10,000 - 220,000/-

**2.3 වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල්වල ප්‍රතිලාභ හිමිවේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂහට වාහනයක් හා රියදුරකු ලබාදෙනු ලැබේ.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අදාළවේ.

### 03. තනතුර - නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ව්‍යුහාත්මක) PS - 02

**3.1 අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

පහත (1) හෝ (2) හෝ (3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල් ඉංජිනේරු (ව්‍යුහාත්මක ඉංජිනේරු) ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සමග**

අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ තලයේ, සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු (ව්‍යුහාත්මක ඉංජිනේරු) ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්,

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග වසර 13 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**සහ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමග අවම වශයෙන් වසර 11 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සතුවිය යුතු අතර, ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

**3.2 වැටුප් ගෙවීම :**

රාජ්‍ය සේවයේ නොවන නිලධාරීන් සඳහා :

185,000 - 2 x 10,000 - 205,000/-

**3.3 වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථ සාධක හා සේවක භාර අරමුදල්වල ප්‍රතිලාභ හිමිවේ.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන අදාළවේ.

### 04. වෙනත් සුදුසුකම් අවශ්‍යතා :

ඉහත තනතුරු දෙකම සඳහා අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

### 05. අයදුම්පත් :

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, තමන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා අනෙකුත් අදාළ තොරතුරු, සමග දූරකථන අංක හා ඊමේල් ලිපින ඇතුළත්ව සකස් කරන ලද අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, 2021.4.19 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**08 වන මහල, "සුහුරුපාය",**
**බත්තරමුල්ල.**